# පිළිතුරු

1. තෝමස් මේට්ලන්ඩ්
2. ජෝන් ඩොයිලි
3. කරතොට ධම්මාරාම හිමි
4. පිළිමතලව්වේ අදිකාරම් හා ඇහැලේපොළ අදිකාරම්
5. බෝගම්බර වැව පුළුල් කිරීම පත්තිරිප්පුව ඉදිකිරීම හා මහනුවර නගරයේ නවීකරණය කටයුතු ආදියට රාජකාරි සේවය සඳහා පැමිණි සබරගමුව, සත් කෝරළය, සතර කෝරළය වැනි ප්‍රදේශවල ජනතාවට රාත්‍රී කාලයේ අගනුවර නවාතැන් ගැනීමට රජු තහනම් කර තිබුණි.
6. හඟුරන්කෙත
7. *බ්‍රිතාන්‍යයන් වෙනුවෙන් රොබට් බ්‍රවුන්රිග්
   *ලංකාව වෙනුවෙන් මොනරවිල කැප්පිටිපොල , මොල්ලිගොඩ , ගලගොඩ අදිකාරම වැනි රදළ රදල ප්‍රධානීන්
8. වාරියපොල ශ්‍රී සුමංගල හිමි
9. ජෝන් ඩොයිලි
10. *නිදහස අහිමි වීම හා රජෙකු නැති වීම පිළිබඳව පසුතැවිල්ල

පහත රට පෘතුගීසි හා ලන්දේසි පාලනය පැවති සමයේ පවා තමන්ගේ ම පාලකයකු යටතේ නිදහස භුක්ති විඳි උඩරට ජනයා 1815 න් පසුව තමන්ට හුරු වූ එකී පාලන ක්‍රමය අහිමි වීම පිළිබඳව කණස්සල්ලෙන් පසුවිය . උඩරට යටත් වීමෙන් පසු උඩරට රජු වශයෙන් සැලකූයේ එවකට බ්‍රිතාන්‍යයේ රජුය. නමුත් උඩරැටියන්ට අවශ්‍ය වූයේ සැතපුම් දහස් ගණනක් ඈත රටක සිටින කිසිදින නොදුටු රජකු නොව තමන්ගේ දුක් ගැනවිල්ලක් ඉදිරිපත්කොට සහනයක් ලබාගත හැකි රජෙකි . උඩරට ජනයාගේ සිත්වල පැවති කණස්සල්ල පිළිබඳව කුංකුනාවේ හිමි විසින් ලියන ලද

අනේ කුහුඹියනේ
තොපටත් රජෙක් ඉන්නේ
මොකදෑ කරන්නේ
අපේ කරුමය අපට වන්නේ යන කවියෙන් පැහැදිලි වේ .

* උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම

1815 ගිවිසුමට අනුව උඩරට සම්ප්‍රදායික තනතුරු ඉංග්‍රීසීන් පවත්වාගෙන ගියද රදලයන්ගේ බලය , සමාජ තත්වය සුරක්ෂිත නොවීම. රදළයන්ගේ සාම්ප්‍රදායික ආදායම් මාර්ග වලට ද පහර වැදුණි.

උදා : ඉංග්‍රීසීන් කඩවත් බදු අහෝසි කිරීම නිසා රදලයන්ට එමගින් ලැබුන ආදායම අහිමි විය . රදළවරුන්ට පාරම්පරිකව හිමි වූ නිලතල වෙනස් කිරීමටද ඉංග්‍රීසීන්ට හැකියාව ලැබුණි . උඩරට ප්‍රවාහන කටයුතු භාර මඩුගේ මුහන්දිරම්

තනතුරට සිංහල නිලධාරියෙකු පත් කිරීම පෙර සිරිතක් සිරිතක් ව පැවතුණ ද ඉංග්‍රීසීන් හජ්ජි මරික්කාල් නම් මුස්ලිම් ජාතික මුහන්දිරම් කෙනෙකු පත් කරන ලදී . මෙම නිසා ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ රදළ ප්‍රධානීන් තුළ බලවත් කලකිරීමක් ඇති වූ අතර මෙය 1818 නිදහස් අරගලයට බලපෑ ආසන්නතම හේතුව විය .

11. *රාජ ප්‍රතිරූපකයා වශයෙන් දොරේසාමි ඌව වෙල්ලස්ස ප්‍රදේශයේ සටන් කාමීන්ට එකතු වීම.
*කොහුකුඹුරේ රටේරාළ වැනි ප්‍රාදේශීය ප්‍රභූවරුන්ගේ සහාය ද ඔහු විසින් ලබාගැනීම.
*මෙම නිසා බදුල්ල උප ඒජන්ත ඩග්ලස් විල්සන් සටන්කරුවන් මර්දනයට හජ්ජි මරික්කාල් ඇතුළු පිරිසක් එවන ලද අතර එහිදී ඔහු ජීවිතක්ෂයට පත්වීම.
*ඉන්පසුව සටන මර්දනයට ගිය ඩග්ලස් විල්සන් ද මරණයට පත්වූ අතර ඉංග්‍රීසීන් සටන මර්දනයට කැප්පිටිපොල එවන ලද ඔහු ඉංග්‍රීසි හමුදා ආපසු යවා සිංහල සටන්කරුවන්ට එකතුව සටනට නායකත්වය ලබා දීම.

12. මොල්ලිගොඩ , එක්නැලිගොඩ හා ඇහැලේපොළ

13. මොණරවිල කැප්පිටිපොල

1818 නිදහස් සටන

මරණීය දණ්ඩනය හිමිවිය

14. *ආසන්නතම හේතුව - ටොරින්ටන් ආණ්ඩුකාරවරයාගේ බදු ප්‍රතිපත්තිය

1848 පමණ වන විට රජයේ ආදායම් තත්වය අඩු වී තිබූ හෙයින් සැලකිය යුතු මුදලක් මහජනතාවගෙන් එකතු කර ගැනීමේ අරමුණින් මුද්දර බද්ද , කරත්ත බද්ද , ඔරු පාරු බද්ද , වෙළඳසැල් බද්ද , තුවක්කු බද්ද, ඇඟ බද්ද, සුනඛ බද්ද යන බදු වර්ග පනවන ලදී. මෙම බදු වර්ග සියල්ලටම මහජන අප්‍රසාදයක් පැවති අතර තුවක්කු බද්ද, ඇඟ බද්ද හා සුනඛ බද්දට එරෙහි විරෝධතා වඩාත් කැපී පෙනුණි.

ගැමි ජනතාව තුවක්කු භාවිතා කරන ලද්දේ ඔවුන්ගේ වගාවන් ආරක්ෂා කර ගැනීමටය. තුවක්කු බද්ද අනුව වසරකට සිලිං දෙකහමාරක් හා එම බදු ගෙවීමට රජයේ කාර්යාල වලට යාමටත් ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු අයදුම්පත් සම්පූර්ණ කිරීමට තවත් මුදලක් වැය කිරීමට සිදුවීම නිසා ඒ සඳහා ජනතා විරෝධතාවයක් පැවතිණි . එසේම සෑම වැඩිහිටි පිරිමියෙකු ම වසරකට දින හයක් නොමිලයේ පාරවල් තැනීමේ කටයුතුවල යෙදී යුතුවූ අතර එසේ නොකළහොත් සිලිං තුනක ඇඟ බද්දක් ගෙවීමට සිදුවිය . පාර බද්ද නමින් හැඳින්වූ මේ පිළිබඳව මහජන විරෝධයක් පැවතුණි . එමෙන්ම නිවසේ ඇති කරන සුනඛයා වෙනුවෙන් ද බද්දක් ගෙවීමට සිදුවීම ජනතාවගේ විරෝධයට හේතු විය.

*කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල බලපෑම

රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය

1833 කෝල්බෘක් ප්‍රතිසංස්කරණ අනුව රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී . කෝපි වගාවට අවශ්‍ය සාරවත් ඉඩම් උඩරට ප්‍රදේශවල පැවැති බැවින් ඒවා රජයට පවරා ගැනීම සඳහා ඉංග්‍රීසීන් ක්‍රියා කරන ලදී . 1840 ස්ටුවර්ඩ් මැකන්සි ආණ්ඩුකාරවරයාගේ මුඩු ඉඩම් පනත මගින් වසර තිහක් නොකඩවා බුක්ති විඳි බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ නොහැකි වගා නොකළ ඉඩම් රාජසන්තක කෙරුණි. බොහෝ ඉඩම් වල අයිතිය පෙන්වීමට නීත්‍යානුකූල ලියකියවිලි නොතිබූ නිසා විශාල ඉඩම් ප්‍රමාණයක් රාජසන්තක විය . රජය ඉතා අඩු මුදලකට විදේශිකයන්ට ලබා දුනි . මෙම නිසා ලාංකික ජනතාවගේ බොහෝ පිරිසකට ඉඩම් අහිමිවීම හා කෘෂිකාර්මික කටයුතු අඩාල වීම නිසා රජය කෙරෙහි කලකිරිණි.

*ගම්සභා අඩපණ වීම

කෝල්බෘක් ප්‍රතිසංස්කරණ මගින් සිදුකෙරුණු අනිවාර්ය සේවා රාජකාරි ශ්‍රම ක්‍රමය අහෝසි කිරීම ගම් සභාවේ පැවැත්මට අහිතකර ලෙස බලපෑවේය . ගම් ප්‍රදේශවල වැව් අමුණු , ඇළ වේලි , පාරවල් ආදිය ඉදි කිරීම, නඩත්තු කිරීම සිදුවූයේ මෙම ගම් සභාව මගිනි . එහෙත් රාජකාරි ශ්‍රම ක්‍රමය අහෝසි කිරීම නිසා ගම් සභාවට ශ්‍රමය ලබා ගැනීම දුෂ්කර විය . ග්‍රාමීය ප්‍රදේශවල සුළු ආරවුල් විසඳීමෙන් ගම් සභාවෙන් වැදගත් සේවයක් සැලසිණි . එහෙත් 1833 ප්‍රතිසංස්කරණය නිසා ගම් සභා සතු අධිකරණ බලය අහිමි විය. මෙබඳු කරුණු නිසා නගරයේ උසාවි කරා තම ප්‍රශ්න විසඳාගැනීමට යා යුතුවීම ජනතාව පීඩාවට පත් කළ කාරණයක් විය .

15. උඩරටියන් බ්‍රිතාන්‍ය පාලකයන්ට පෙත්සමක් ඉදිරිපත් කිරීමට ගිය අවස්ථාවේ ඇති ඇති වූ කලබලකාරී තත්ත්වය හමුවේ එය පාලනය කිරීමට ක්‍රියා කළ ආකාරය අනුව සටන ව්‍යාප්ත විය . මාතලේ ප්‍රදේශයෙන් ආරම්භ වූ විරෝධතාවය දඹුල්ල , වාරියපොල , කුරුණෑගල වැනි ප්‍රදේශ වලට ද පැතිරිණි. රජයේ බඳු ප්‍රතිපත්තියෙන් පීඩනයට පත් ජනතාව අතරින් මතුවූ ගොංගාලේගොඩබණ්ඩා , වීර පුරන් අප්පු, ඩිංගිරාල , දිනේස් යන අය සටන මෙහෙය වූ අතර සටන අතරතුර දී දඹුලු විහාරයට රැස්ව එහි නායක ස්වාමීන් වහන්සේලාගේ සහාය ඇතිව ගොන්ගාලේගොඩ බණ්ඩා රජු වශයෙන් අභිෂේක කළහ.